**මාවතගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) උදාගම්මාන ගම් සහා පාර කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාළ රු.50,000 ක රඳවුම් මුදල ගෙවා තිබියදී, ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගබඩා නිකුත් කිරීම් රු.689,104 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.27,372,555 ක නොසැසඳීම් පැවතුණි.

#### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.112,908,991ක් වූ ලැබියයුතු ශේෂවලින් වර්ෂයකට වැඩි කාලයක් හිඟහිටි රු.29,618,521 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.40,018,159ක් වූ ගෙවියයුතු ගිණුම්වලින් වර්ෂ 03 ක් ඉක්මවූ රු.4,810,167 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.110,341,695 ක් වූ ගිණුම් විෂයයන් 15 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මු.රෙ 570 හා 571 | 143,203 | කාලය ඉකුත් වී තිබෙන තැන්පත් 59 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) ඡේදය | 311,253 | ඉඩදිය හැකි කාලය ඉකුත් වී තිබුණු ප්‍රසම්පාදන තීරණවල මිළ ගණන් මත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 11 කදී මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| (ඇ) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සභාව සතු වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| (ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 2015 දෙසැම්බර් 30 දිනැති අංක ව.ප.පා.දෙ/01/12/01/34 දරන චක්‍රලේඛය | 55,670 | සභාවේ ලේකම්වරයා විසින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කර සභාවට අයත් කැබ් රථයක් කි.මී.5,197 ධාවනයේ යොදවා තිබුණි |

## 1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නියමිත අනුමැතියක් නොමැතිව ජ'නල් සටහන් 6 කින් රු.65,850 ක පුස්තකාල තැන්පත් සහ රු.5,203,293 ක් වූ ණයහිමි අගයක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ආ) තැන්පත් ශේෂ නිවැරදි කිරීම වශයෙන් සමුච්චිත අරමුදලට රු.205,336 ක් හර හා රු.849,747 ක් බැර කිරීමට නියමිත අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,726,634 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.18,304,262 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 බිල්කළ ආදායම් | 2016 රැස්කළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 4,760 | 5,090 | 3,936 | 4,414 | 3,234 | 2,069 | 1,860 | 4,666 |
| (ii) කුලී | 8,565 | 7,458 | 7,286 | 2,638 | 7,930 | 7,302 | 4,364 | 2,466 |
| (iii) බලපත්‍ර ගාස්තු | 802 | 281 | 281 | 70 | 1,204 | 1,047 | 1,048 | 70 |
| (iv) වෙනත් ආදායම් | 115,616 | 105,043 | 82,936 | 77,195 | 120,663 | 96,527 | 76,372 | 49,613 |
| එකතුව | 129,743 | 117,872 | 94,439 | 84,317 | 133,031 | 106,945 | 83,644 | 56,815 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂවලට අදාළව අයවීම රුපියල් මිලියන 26 ක් විය.

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම සහ පසුගිය වර්ෂවල හිඟ ආදායම් සමග රුපියල් මිලියන 174 කින් රුපියල් මිලියන 94 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රුපියල් මිලියන 57 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 84 ක් වී තිබුණි.

## 2.2.3 වරිපනම් හා බදු

-------------------

වර්ෂය ආරම්භයට රු.4,665,952 ක් වූ හිඟයෙන් වර්ෂය තුළ සියයට 13 ක් වූ රු.653,000 ක් පමණක් රැස්කරගෙන තිබුණි. සභාවේ හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සතුටුදායක තත්ත්වයක නොපැවතුණි.

## 2.2.4 කුලී

-----

වර්ෂය ආරම්භයට පැවති රු.2,466,000 ක් වූ හිඟයෙන් වර්ෂය තුළ සියයට 40 කට සමාන රු.984,000 ක් අයකරගෙන තිබුණි. වසර 10 ඉක්මවා තිබුණු රු.1,082,046 ක් සිනමා ශාලාවකින් ලැබියයුතුව තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 කාර්යය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 14ක් සම්බන්ධයෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

------------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඉටු නොකළ කාර්යයන්

---------------------------

රු.2,000,000 ක් වූ අයවැයගත කර්මාන්ත 04 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

i. එකතු කරනු ලබන කසළ වලින් සියයට 60 ක් පමණ වූ දිරන කසළවලින් කොම්පෝස්ට් පොහොර නිපදවා ඉතිරි නොදිරන කසළ රජයේ ඉඩමක වලවල්වලට අවිධිමත් ලෙස බැහැර කර තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ එකතු කරන ලද කසළ ටොන් 720 කින් කොම්පෝස්ට් පොහොර ටොන් 08 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

-----------------

ඝෝශාතකාගාරයේ අපද්‍රව්‍ය විධිමත් ලෙස බැහැර නොකිරීම හේතුවෙන් මහජනතාවගේ සෞඛ්‍යට මෙන්ම පරිසර දූෂණයක්ද සිදුවිය හැකිව තිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාවට පුළුල් දැනුමක් නොතිබුණු නමුත් දිළිඳුකම පිටු දැකීම අරමුණු කරගත් ස්වයංරැකියා සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. අවශ්‍ය යන්ත්‍ර සහ මූල්‍යමය හැකියාව නොමැති වීම හා නොදැනුවත්භාවය වැනි හේතූන් මත තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 20 කින් රු.400,000 ක් වූ පෙරසැරි ගාස්තු අය කරගැනීමට සහ අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ දෛනික කටයුතු සඳහා අවශ්‍ය විවිධ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පුස්තකාලාධිපති තනතුරු 03 ක පුරප්පාඩු වසර ගණනාවක් තිස්සේ පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**3.4.1 නිශ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්**

**-------------------------------------**

සභාව සතු කැබ් රථයක්, ප්‍රතිලාභීන්ට දියයුතු ජංගම වෙළඳ කුටි 02 ක් සහ සභාවට හිමිකමක් නොමැති ගිලන් රථයක් වසර ගණනාවක් සභා භූමියේ නිශ්කාර්යව පැවතුණි.

**3.4.2 දෘෂ්‍ය අක්‍රමිකතා**

-------------------

මාවතගම නගර මධ්‍යයේ වූ මාර්ග රක්ෂිතයේ කිසියම් පුද්ගලයෙකු විසින් අනුමත සැලසුමට පටහැනිව ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදි කරමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

---------------

**3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.5,243,376 කින් සංවර්ධනය කර තිබුණු උඩ ඉගුරුවත්ත සිට පල්ලේ ඉඟුරුවත්ත දක්වා වූ මාර්ගය, ගල්වල මාර්ගය, ආකාවේ ප්‍රධාන මාර්ගය, සාමෝදය නිවාස අතුරු මාර්ග II වන මාවත, මාවතගම සමඟි උයන මාර්ගය සහ ඩෙනවර්වත්ත මාර්ගය යන මාර්ග නියමිත ප්‍රමිතියට කොන්ක්‍රීට් නොකිරීම හේතුවෙන් මාර්ග මතුපිට ගල් හා වැලි මතුවී මාර්ගය ගැලවෙමින් පැවතුණි.

(ආ) මාවතගම පොල මාර්ගය රු.1,129,489 කින් සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අඩි 20 ක් පමණ දිගින් යුතු ස්ථාන 03 ක කොන්ක්‍රීට් කර්බ් විනාශ වීම මෙන්ම මාර්ගයේ අතුරා තිබුණු කුට්ටිගල් විනාශ වෙමින් පවතින බව 2017 ඔක්තෝබර් 30 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------

**4.1 අයවැය පාලනය**

----------------

අයවැයගත නොකළ කර්මාන්ත 05 කට රු.2,172,545 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**-----------------**

විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| ----------- | ------------- |
| (අ) ආදායම් පාලනය | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පාලනය | (i) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදීගෙන නොතිබීම. |
| (ඈ) අයවැය පාලනය | අයවැයගත නොකර වියදම් සිදුකර තිබීම. |